# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/22 – 2021 අගෝස්තු මස 11 වැනි බදාදා – 2021.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 163 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2020/HW/143.
ප්‍රා. ලේ.ගේ යොමු අංකය: DSO/HOM/LAC/132.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 අගෝස්තු මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.** – ප්‍රාදේශීය ලේකම්, හෝමාගම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරිපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හිරිපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක CO/HMG/2020/566 හා 2021.02.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගල්වලදෙණිය – ප්‍රමාණය: හෙක්. 0.0167**
උතුරට: දයාසිරි ප්‍රඥාරත්න සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත, දොන් හරින්ද්‍ර දසනායක විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත, මානෙල් ධම්මිකා පතිරගේ විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත සහ පුණ්‍යවතී පතිරගේ විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත; නැගෙනහිරට: පුණ්‍යවතී පතිරගේ විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත, ජල මාර්ගය, නන්දනී රණසිංහ විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත සහ දොන් හරින්ද්‍ර දසනායක විසින් හිමිකම් කියනු ලබන ගල්වලදෙණිය; දකුණට: දොන් හරින්ද්‍ර දසනායක විසින් හිමිකම් කියනු ලබන ගල්වලදෙණිය සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.), දයාසිරි ප්‍රඥාරත්න සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත, දොන් හරින්ද්‍ර දසනායක විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත සහ මානෙල් ධම්මිකා පතිරගේ විසින් හිමිකම් කියනු ලබන ගලබොඩවත්ත.

08 - 390